# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

**10 ශ්‍රේණිය** | **නර්තනය - I**

නම/ විභාග අංකයඃ ........................................ කාලය ;- පැය 1 යි

★ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

★ **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (i), (ii), (iii), (iv) වරණ අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**

---

1) මාත්‍රා 2+4 තාලයට අයත් සම ග්‍රහයට අනුව ගායනා කරන වන්නමකි.
   i. තුරඟා ය     ii. වෛරොඩි ය
   iii. සැවුලා ය     iv. සිංහරාජ ය

2) නර්තන විෂය හැදෑරීමට ප්‍රවිෂ්ඨ වන ආධුනික ශිල්පියාගේ සුවිශේෂී කැරකීමේ ලක්ෂණ පුහුණු කිරීම සඳහා තුන්වන ගොඩ සරඹය ඇසුරෙන් සකස් කර ඇති ගොඩ සරඹයකි.
   i. බඹර සරඹ ය     ii. පැනීම් සරඹ ය
   iii. චන්ද්‍රිකා සරඹ ය     iv. දෑත පෑගීම ය

3) මාත්‍රා 2+2+4 .................... නමින් හඳුන්වනු ලබයි.
   i. සුළු මැදුම් මහ තුන්තිත     ii. දෙමැදුම් මහ තුන්තිත
   iii. සුළු දෙමහ තුන්තිත     iv. දෙසුළු මහ තුන්තිත

4) තුන් සරණේ කවි ඇතුළත් වන විනෝදස්වාදය අරමුණු කරගත් ගායනා විශේෂයෙකි.
   i. චාමර     ii. ඔන්චිලි     iii. ප්‍රශස්ති     iv. රබන්

5) 1 2 | 1 2 | 1 2 3 4 යන තුන්තිතේ තාල රූපයට අදාළව නිවැරදිව සංකේත යොද ඇති පිළිතුර වන්නේ
   i. ^ ^ /     ii. / / ^     iii. ^ / /     iv. ^ / ^

6) "ඈත සිටන් එන්නී සෙල්ලි සෙල්ලියේ" යන කවිය ගායනයේ දී භාවිතා කළ හැකි තාල රූපයට අයත් උඩරට වන්නමක් වන්නේ
   i. හනුමා ය     ii. වෛරොඩි ය
   iii. සිංහරාජ ය     iv. සැවුලා ය

7) උඩරට නර්තන සම්ප්‍රදය හදාරන ආධුනිකයෙකු ප්‍රථම වරට චාරිත්‍රානුකූලව රංග කුසලතා එළි දක්වන්නේ,
   i. ගුරු වරම් දීමේ දී ය     ii. මඩු බැසීමේ දී ය
   iii. කළඑළි මංගල්‍යයේ දී ය     iv. සාම්ප්‍රදයික රඟමඩලක දී ය

8) යුද්ධ සේනා ගමන් කරන මඟ දැක්වීම, ඔවුන්ට ධෛර්යය, ශක්තිය, ජීවය ලබාදීම යන කාර්යයන් සඳහා වාදනය කළේ
   i. අණබෙර     ii. වදබෙර     iii. මළබෙර     iv. රණබෙර

9) ආගමික සිද්ධස්ථාන ආශ්‍රිතව පුද පූජාවලට බහුලව යොදගෙන ඇත්තේ
   i. ගැටබෙරය, දවුල හා හොරණෑව ය     ii. දවුල, හොරණෑව හා අත් රබාන ය
   iii. ගැටබෙරය, දවුල හා තම්මැට්ටම ය     iv. දවුල, තම්මැට්ටම හා හොරණෑව ය

10) ගැට බෙරයෙහි ගැටිවැල සහ බෙර කඳ සඳහා සුදුසු දැව වර්ග පිළිවෙලින් සඳහන් වන්නේ,

i. කිරිඳිවැල් හා කිතුල් ය
ii. වේවැල් සහ පොල් ය
iii. කිරිඳි වැල් හා රත් ඇහැළ ය
iv. ජේර හා ඇහැළ ය

11) මෙම අඩව්ව සම්පූර්ණ කිරීමට සුදුසු පද කොටස් පිළිවෙළින් සඳහන් පිළිතුර වන්නේ

"තත් තකට තකරොං .......... තක රොං
................ කිටි තකට කුන්දත් ජික රොං"

i. තකජිත් තකජිත් රුද, තක ජිං තකට කුකුද
ii. තක්කඩ තක්කඩ කුද, තක රොං ගජිං ජිකුද
iii. තක්කඩ ජික්කඩ කුකුද, ගජ්ජිං ගජිං ජිකුද
iv. තක්කඩ ජික්කඩ රුද, තකරොං ගජිං ජිගත

12) ප්‍රත්‍යංග, අංග සහ උපාංග පිළිවෙළින් දැක්වෙන වරණය කුමක්ද?

i. කඳ, ගාත්‍රා සහ තොල්
ii. බෙල්ල, හිස සහ ඇස්
iii. දෙපා, දණහිස සහ ඇඟිලි
iv. උරහිස, ඇස් සහ වළලුකර

13) "හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්" යන ගීතය ඇතුළත් වේදිකා නාට්‍ය වන්නේ

i. බන්දුල ජයවර්ධන ශූරීන්ගේ බෙර හඬ නාට්‍යයයි.
ii. එදිරිවීර සරත්චන්ද්‍ර ශූරීන්ගේ මනමේ නාට්‍යයයි.
iii. දයානන්ද ගුණවර්ධන ශූරීන්ගේ නරි බෑණා නාට්‍යයයි.
iv. හෙන්රි ජයසේන ශූරීන්ගේ කුවේණි නාට්‍යයයි.

14) කුම්භ කතාව හා කරදිය මුද්‍රා නාට්‍යයන්හි රංග වස්ත්‍රාභරණ නිර්මාණය කළ ශිල්පීන් පිළිවෙලින් සඳහන් වෙන්නේ

i. අංජලිකා චිත්‍රසේන මහත්මිය හා චිත්‍රසේන ඩයස් මහතා ය.
ii. ටානියා බැරකෝමා මහත්මිය හා මහින්ද ඩයස් මහතා ය.
iii. මහේෂ් උමගිලිය මහතා හා සෝමබන්ධු විද්‍යාපති මහතා ය.
iv. රොබට් ජූලියන් මහතා හා ලයනල් අල්ගම මහතා ය.

15) චරිතාංග අංග රචනයකදී අංග රචනා කාර්යයන්ට මුලින්ම භාජනය කරනුයේ

i. මුහුණයි
ii. දෙඇසයි
iii. නාසයයි
iv. නළලයි

16) තුන්තිතේ තාල රූපයකට වාදනය කළ හැකි උඩරට නර්තන සම්ප්‍රදයේ බෙර පදයක් තෝරන්න.

i. ජිං කුඳ ජිමිත ගත් තත් තකට
ii. දොං තකු දොං තකු දොං ජිං ගත්තත් ජං තරිකිට
iii. දොං තකු දොං ජිංතක තරිකිට
iv. ගොග් ගොග් ජිං ජිංතක ජිජිකුද

17) දෙළොස්වන ගොඩ සරඹය් කස්තිරම පිළිබඳ නිවැරදිම ප්‍රකාශය කුමක්ද?

i. දීර්ඝතම කස්තිරමයි, කැරකීම් ක්‍රමයක් ප්‍රගුණ කෙරේ.
ii. දීර්ඝතම කස්තිරමයි, පැනීම් ක්‍රමයක් ප්‍රගුණ කෙරේ.
iii. බීජාක්ෂර අනුව මුදුන් වේ. සුරල් පෑගීමේ ප්‍රගුණ කෙරේ.
iv. බීජාක්ෂර අනුව මුදුන් වේ. දෑත පෑගීමේ ප්‍රගුණ කෙරේ.

18) උඩරට නර්තන සම්ප්‍රදයට ආවේණික පාරිභාෂික වචන තුනකි.

i. පා සරඹ, ගොඩ සරඹ සහ කස්තිරම
ii. කස්තිරම, ගොඩ සරඹ සහ යක්ඇනුම
iii. කස්තිරම, සීරුමාරුව සහ යක්ඇනුම
iv. මණ්ඩිය, වන්නම් සහ ආවැන්දුම

19) මහා වංශයේ සඳහන් ආකාරයට නැටුම්, ගැයුම්, වැයුම් සහිත ගිරිභණ්ඩ නම් පූජාවන් සිදුකරන ලද රජතුමා වන්නේ

| | | | |
|---|---|---|---|
| i. | පණ්ඩුකාභය රජු ය | ii. | භාතික අභය රජු ය |
| iii. | මහා පරාක්‍රමබාහු රජු ය | iv. | මහා දාඨික මහානාග රජු ය |

20) කරදිය මුද්‍රා නාට්‍යයේ "චන්ද" ගේ චරිතය නිරූපණය කළ ශිල්පියා වූයේ

| | | | |
|---|---|---|---|
| i. | සේන වලවේ ය | ii. | චිත්‍රසේන ඩයස් ය |
| iii. | මහින්ද ඩයස් ය | iv. | කේ. එන්. එස්. අටුගොඩ ය |

21) සොකරි ගැමි නාටකය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ

i. හේනවල, ලග්ගල, තලාතු ඔය, කළුන් දැව
ii. හඟුරන්කෙත, මාතලේ, කොටුගොඩ, කොනකගල
iii. නිලදණ්ඩාහින්න, හිගුරක්ගොඩ, දික්පිටිය, හපුන්දෙණිය
iv. පාතහේවාහැට, උඩහේවාහැට, කපුලියැද්ද, යටියන්තොට

22) පතල් කර්මාන්තය ආශ්‍රයෙන් නර්තනයක් නිර්මාණය කිරීමේ දී තේමාවේ ක්‍රමික ගලායාමට අදළ ක්‍රියාකාරකම් අනුපිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.

i. පතලට යාම, මැණික් වෙන් කිරීම, ඉල්ලම් ගැරීම අලෙවිය හා සතුටු වීම
ii. පතල කැණීම, ඉල්ලම් ගැරීම, මැණික් වෙන් කිරීම, විවිධ ආභරණ නිෂ්පාදනය හා අලෙවිය
iii. පතල කැණීම, ඉල්ලම් ගැරීම, වර්ණ ගැන්වීම, ආභරණ නිෂ්පාදනය
iv. පතලට යාම, පතල කැණීම, ඉල්ලම් ගැරීම, අලෙවිය හා සතුටු වීම

23) "කොණ්ඩය පිටුපසට බැඳ සිටින අතර කණ්ණාඩියක් සහ දිග රැවුලක් පැළැද සිටී. කුදු බව පෙන්වීමට පිටට කොට්ටයක් බැඳ ඇත. බඩ ඉදිරියට නෙරා ඇති අතර මේස් බැනියමක් ඇද ඊට උඩින් කෝට් කබායක් ද සරමක් ද ඇඳ ඇත."
මෙයින් හඳුන්වා දෙනු ලබන්නේ සොකරි නාටකයේ එන

i. සොකරියගේ චරිතයයි
ii. ගුරුහාමිගේ චරිතයයි
iii. පරයාගේ චරිතයයි
iv. වෙදරාළගේ චරිතයයි

24) සමාන අරුත් දක්වා නොමැති වචන යුගලය තෝරන්නග

| | | | |
|---|---|---|---|
| i. | බෙර සරඹ - හස්ත සාධන | ii. | ස්වරාක්ෂර - බීජාක්ෂර |
| iii. | ගර්භාක්ෂර - උපකාරාක්ෂර | iv. | ගර්භාක්ෂර - බීජාක්ෂර |

25) 14 වන සියවසේ දී ශ්‍රී ලංකාවට පැමිණි ඉබන් බතුතා නැමැති සංචාරකයාගේ වාර්තාව අයත් වන්නේ,

| | | | |
|---|---|---|---|
| i. | මහනුවර යුගය | ii. | ගම්පොළ යුගය |
| iii. | පොළොන්නරු යුගය | iv. | කුරුණෑගල යුගය |

26) ඉතිහාසගත තොරතුරු අනුව බලන කල බොහෝ රාජ්‍ය පාලකයෝ නැටුම්, ගැයුම්, වැයුම් සඳහා අනුග්‍රහය දක්වා ඇති බව මහාවංශයේ සඳහන් වෙයි. මහා වංශ තොරතුරු අතර සඳහන් නොවන රජ කෙනෙකු වන්නේ

| | | | |
|---|---|---|---|
| i. | පණ්ඩුකාභය රජතුමා | ii. | මහා පරාක්‍රමබාහු රජතුමා |
| iii. | භාතිකාභය රජතුමා | iv. | මහා දළියාමානා රජතුමා |

27) එකැස් බෙරය, පොකුරු බෙරය හා සිරිවස යන නම් වලින් හඳුන්වනු ලබන දේශීය අවනද්ධ භාණ්ඩ නාමාවලිය පිළිවෙළින් සඳහන් වන්නේ

| | | | |
|---|---|---|---|
| i. | රබාන, තම්මැට්ටම, උඩැක්කිය | ii. | තම්මැට්ටම, උඩැක්කිය, රබාන |
| iii. | උඩැක්කිය, දවුල, තම්මැට්ටම | iv. | දවුල, රබාන, උඩැක්කිය |

28) "කට දොඩවන්නේ ගිය ගිය තැන පෙරළෙන්නේ
කොක් හඬලන්නේ සොකරිය දෙසයි බලන්නේ" මෙයින් කියවෙන සොකරි නාටකයට අයත් චරිතය වන්නේ

i. සොකරි  ii. ගුරුහාමි  iii. වෙදරාළ  iv. පරයා

29) දෙසුළු මැදුම් තුන්තිතට ප්‍රස්තාර කළ හැකි කවියක් වන්නේ

i. වරලස නිල් පැහැයෙන් ද
ii. නන් උතුම් පෙම්බර ගුණ රුසිරු රබානා
iii. පෑවිය ගනදුරු දුරැර දිවාකර
iv. සොබමන් දෙව්වරු සදෙනෙක් එතැනට

30) මහනුවර යුගයේ විමලධර්මසූරිය රජ සමයේ ලංකාවට පැමිණ දේශීය නර්තන කලාව පිළිබඳ අදහසක් දැක්වූ දේශාඨකයෙකි.

i. රොබට් නොක්ස්
ii. ඉබන් බතූතා
iii. ස්පිල්බර්ජන්
iv. ෆාහියන්

31) සුරල් පෑගීම පිළිබඳ මනා පුහුණුවක් ලබාදීම සඳහා සකස් වූ කස්තිරම් ඇතුළත් ගොඩ සරඹ කාණ්ඩය වන්නේ

i. බඹර, පැනීම්, චන්ද්‍රිකා
ii. අංගහාර, පැනීම්, චන්ද්‍රිකා
iii. අර්ධ චක්‍ර, දෑත පෑගීම, බඹර
iv. අංගහාර, දෑත පෑගීම, බඹර

32) "දොං තකු දොං තකු දොං ජිං - ගත් තත් ජිං තරිකිට" මෙම බෙර පදය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ

i. තුන්තිතේ ප්‍රභේදයකට අයත් බෙර පදයකි.
ii. දෙසුළු මහ තුන්තිතට අයත් බෙර පදයකි.
iii. දෙතිතේ ප්‍රභේදයකට අයත් බෙර පදයකි.
iv. මාත්‍රා 4 තනිතිතට වාදනය කළ හැකි බෙර පදයකි.

33) ත්‍රිවිධ ලයට සරඹ අභ්‍යාස කිරීමේදී දෙගුණ ලෙස නම් කරනුයේ ................. ලය වේ.

i. විලම්භ  ii. මධ්‍ය  iii. ධෘත  iv. අතිධෘත

34) දෙතිතේ තාල රූපයකට වාදනය කළ හැකි උඩරට නර්තන සම්ප්‍රදයේ බෙර පදය තෝරන්න.

i. කුද ගත ගත දොම්
ii. ජිංගත ගො ගො
iii. දොංතකු දොංජිං ගත්තත් ජිංගත
iv. දෝං ජිං ජිං තකට දොංතක

35) වෙස් ඇඳුම් කට්ටලයේ පපු ප්‍රදේශයට පළඳින ආභරණය වන්නේ

i. ශිඛා බන්ධනය
ii. අවුල් හැරය
iii. කෛමෙත්ත
iv. හගල

36) සුබ නැකතින් කිරි ගසක අත්තක් කපා ගෙනැවිත් යාතිකා කොට පවත්වනු ලබන චාරිත්‍රය හඳුන්වනු ලබන්නේ

i. බිසෝ කප සිටුවීම නමිනි
ii. කිරිගස සිටුවීම නමිනි
iii. කාලපන්දම් ගස සිටුවීම නමිනි
iv. කප් සිටුවීම නමිනි

37) අතත ගණයට අයත් වාද්‍ය භාණ්ඩයක් වන මෙහි දිග තුන්වියත් තුනගුලක් වේ.

i. ගැට බෙරය
ii. දෙවොල් බෙරය
iii. දවුල
iv. තම්මැට්ටම

38) උඩරට වන්නමක කොටස් ගණන,

i. තුනයි  ii. හතරයි  iii. පහයි  iv. හයයි

39) වන්නමක තානම මගින් එහි .......... කියවෙන අතර කවි වලින් එහි ............ පිළිබඳව කියවේ.

i. නාද මාලාව, විස්තරය
ii. තාලය, විස්තරය
iii. නාද මාලාව, ප්‍රස්තුතය
iv. රිද්මය, වර්ණනාව

40) ශාන්තිකර්ම අවස්ථා සඳහා යොද ගන්නා ලද ගායනා ගැමි නර්තනයේදී ද යොදා ගෙන ඇත.

i. ගොයම්  ii. පන්තෙළීම  iii. වාමර  iv. පතුරු